කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 09 WW/TC/20/12/02/09
වර්ණය : රතු

# “බුරවි”සුළි කුණාටුව පිළිබඳ අනතුරු ඇඟවීමේ නිවේදනය

ලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
**2020 දෙසැම්බර් මස 02 වන දින පෙ.ව. 04.30 ට නිකුත් කරන ලදී.**

## දිවයින වටා මුහුදු ප්‍රදේශ සහ ගොඩබිම සඳහා

## අවදානයෙන් සිටින්න!

**නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින "බුරවී" සුළි කුණාටුව දෙසැම්බර් 01 ප.ව. 23.30 වන විට ත්‍රිකුණාමලයට කි.මී. 330 ක් නැගෙනහිර ට බරව ගිනිකොණ දෙසින් උතුරු අක්ෂාංශ 8.1 ත් නැගෙනහිර දේශාංශ 84.2 ත් ආසන්නව ස්ථානගතව පැවතුනි.**

**මෙම පද්ධතිය බටහිරට නැඹුරුව වයඹ දෙසට ගමන් කර මඩකලපුව සහ පේදුරු තුඩුව අතරින් ත්‍රිකුණාමලයට ආසන්නව ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළට හෙට (දෙසැම්බර් 02) සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී ඇතුළු වේ යැයි බලාපොරොත්තු වේ.**

**සුළි කුණාටුව සමග සුළගේ වේගය පැ .කි.මී. 75-85 පමණ වන අතර විටින් විට පැ .කි.මී. 95 දක්වා වැඩිවේ. මෙය ක්‍රමයෙන් බටහිර දෙසට ගමන් කර මන්නාරම් බොක්ක වෙත පැමිණෙණු ඇතැයි බලාපොරොත්තු වේ.**




**Source: RSMC India**

| | පුරෝකථන සුළි කේන්ද්‍රය සහ මධ්‍ය ලක්ෂයේ සිට ත්‍රිකුණාමලයට දුර | | |
|---|---|---|---|
| දිනය/ වේලාව (ශ්‍රී. ලං. ස. වේ.)(පැය) | ස්ථානය (උතුරු අක්ෂාංශ/නැගෙනහිර දේශාංශ) | වර්ගය | ත්‍රිකුණාමලයට දුර (කි.මී) |
| 2020.12.02/0530 | 8.3N/83.4E | සුළි කුණාටුව | 130 |
| 2020.12.02/1130 | 8.5N/82.6E | සුළි කුණාටුව | 80 |
| 2020.12.02/1730 | 8.7N/81.3E | සුළි කුණාටුව | 10 |
| 2020.12.02/2330 | 8.8N/80.7E | සුළි කුණාටුව | දිවයින තුල |

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## අනතුරු ඇඟවීම්:

**මුහුදු ප්‍රදේශය සඳහා:**

ඉහත පද්ධතියේ බලපෑම හේතුවෙන්, දෙසැම්බර් 02 සිට දෙසැම්බර් 03 දක්වා,

- දිවයින වටා මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය ක්ෂණිකව පැ.කි.මී. (80-100) පමණ ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශය විටින් විට ඉතා රළු හෝ දළ රළු විය හැක.
- මෙම පද්ධතිය නැගෙනහිර වෙරළට ඇතුළුවන කාලයේදී මුහුදු රළ, උදම් රළ මට්ටමට වඩා මීටර් 1ක් පමණ ඉහල යාමේ හැකියාවක් පවතී.

## ගොඩබිම ප්‍රදේශ සඳහා:

සුළං සඳහා අනතුරු ඇඟවීම

| පළාත | දෙසැ.02 | දෙසැ.03 |
|---|---|---|
| උතුර | විටින් විට පැ.කි.මී.(80-100) පමණ දක්වා වන ඉතා තද ප්‍රහාරාත්මක සුළං | විටින් විට පැ.කි.මී.(80-100) පමණ දක්වා වන ඉතා තද ප්‍රහාරාත්මක සුළං |
| උතුරු-මැද | විටින් විට පැ.කි.මී.(80-100) පමණ දක්වා වන ඉතා තද ප්‍රහාරාත්මක සුළං | විටින් විට පැ.කි.මී.(80-100) පමණ දක්වා වන ඉතා තද ප්‍රහාරාත්මක සුළං |
| නැගෙනහිර | විටින් විට පැ.කි.මී.(80-100) පමණ දක්වා වන ඉතා තද ප්‍රහාරාත්මක සුළං | විටින් විට පැ.කි.මී.(80-100) පමණ දක්වා වන ඉතා තද ප්‍රහාරාත්මක සුළං |
| වයඹ | විටින් විට පැ.කි.මී.(80-100) පමණ දක්වා වන ඉතා තද ප්‍රහාරාත්මක සුළං | විටින් විට පැ.කි.මී.(80-100) පමණ දක්වා වන ඉතා තද ප්‍රහාරාත්මක සුළං |
| බස්නාහිර | විටින් විට පැ.කි.මී.(80-100) පමණ දක්වා වන ඉතා තද ප්‍රහාරාත්මක සුළං | විටින් විට පැ.කි.මී.(80-100) පමණ දක්වා වන ඉතා තද ප්‍රහාරාත්මක සුළං |
| මධ්‍යම | විටින් විට පැ.කි.මී.(80-100) පමණ දක්වා වන ඉතා තද ප්‍රහාරාත්මක සුළං | විටින් විට පැ.කි.මී.(80-100) පමණ දක්වා වන ඉතා තද ප්‍රහාරාත්මක සුළං |
| සබරගමුව | විටින් විට පැ.කි.මී.(80-100) පමණ දක්වා වන ඉතා තද ප්‍රහාරාත්මක සුළං | විටින් විට පැ.කි.මී.(80-100) පමණ දක්වා වන ඉතා තද ප්‍රහාරාත්මක සුළං |
| සෙසු පළාත් | විටින් විට පැ.කි.මී.(60-70) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මී.(60-70) පමණ දක්වා වන තද සුළං |

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

වැසි සඳහා අනතුරු ඇඟවීම

| පළාත | දෙසැ.02 | දෙසැ.03 |
|---|---|---|
| උතුර | බොහෝ ස්ථානවල නිරන්තර වැසි; ඇතැම් ස්ථානවලට මි.මී. 200 ට වැඩි ඉතා තද වැසි; | බොහෝ ස්ථානවල විටින් විට වැසි; ඇතැම් ස්ථානවලට මි.මී. 100 ට වැඩි තද වැසි; |
| උතුරු-මැද | බොහෝ ස්ථානවල නිරන්තර වැසි; ඇතැම් ස්ථානවලට මි.මී. 200 ට වැඩි ඉතා තද වැසි; | බොහෝ ස්ථානවල විටින් විට වැසි; ඇතැම් ස්ථානවලට මි.මී. 100 ට වැඩි තද වැසි; |
| නැගෙනහිර | බොහෝ ස්ථානවල නිරන්තර වැසි; ඇතැම් ස්ථානවලට මි.මී. 200 ට වැඩි ඉතා තද වැසි; | බොහෝ ස්ථානවල විටින් විට වැසි; ඇතැම් ස්ථානවලට මි.මී. 100 ට වැඩි තද වැසි; |
| වයඹ | බොහෝ ස්ථානවල නිරන්තර වැසි; ඇතැම් ස්ථානවලට මි.මී. 200 ට වැඩි ඉතා තදවැසි; | බොහෝ ස්ථානවල නිරන්තර වැසි; ඇතැම් ස්ථානවලට මි.මී. 200 ට වැඩි ඉතා තදවැසි; |
| දකුණු | තැනින් තැන වැසි ඇතැම් ස්ථානවලට මි.මී. 50 ට වැඩි වැසි; | තැනින් තැන වැසි ඇතැම් ස්ථානවලට මි.මී. 50 ට වැඩි වැසි; |
| සෙසු පළාත් | බොහෝ ස්ථානවල විටින් විට වැසි; ඇතැම් ස්ථානවලට මි.මී. 100 ට වැඩි තද වැසි; | බොහෝ ස්ථානවල නිරන්තර වැසි; ඇතැම් ස්ථානවලට මි.මී. 200 ට වැඩි ඉතා තදවැසි; |

අවදානම් රහිත | අඩු අවදානම් | තරමක් අවදානම් | අධි අවදානම්

## අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:

- නැවත දැනුම් දෙන තුරු දිවයින වටා මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.
- දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස හැකි ඉක්මණින් ගොඩබිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.

## ගොඩබිම ප්‍රදේශය සඳහා:

- දෙසැම්බර් 01 සිට දෙසැම්බර් 03 දක්වා ඇතිවිය හැකි අයහපත් කාලගුණික තත්වය පිළිබඳ විමසිලිමත්වන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.
- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

මීළඟ නිවේදනය 2020.12.02 දින පෙ.ව. 07.30 ට නිකුත් කෙරේ.

වර්ෂාපතනය(මි.මී) : තරමක් තද වැසි: 50 -100, තද වැසි: 100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි